සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

88 S I

10 ශ්‍රේණිය

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ඕනෑම වෘත්තයක අරය මිණුමක් ලෙස ගෙන එම වෘත්තයේ පරිධිය වටා කවකටුවෙන් සලකුණු කරගෙන යාමේ දී ලැබෙන කොටස් ප්‍රමාණය,
(1) 3 කි. (2) 6 කි (3) 4 කි. (4) 8 කි.

02. පහත දක්වා ඇත්තේ සමාංශක ප්‍රක්ෂේපණ රූපයකි. එහි x හි (කෝණයේ) අගය වන්නේ,

(1) 30° කි.
(2) 60° කි.
(3) 45° කි.
(4) 55° කි.



03. බහුඅස්‍ර සඳහා උදාහරණයක් නොවන්නේ මින් කුමක් ද?


(1)


(2)


(3)


(4)

04. නිර්මාණ රේඛා ඇඳීම හා මාන දැක්වීම සඳහා භාවිත කරන රේඛා වර්ගය වන්නේ,
(1) කඩ රේඛා ය. (2) ඝන අඛණ්ඩ රේඛා ය.
(3) සිහින් දාම රේඛා ය. (4) සිහින් අඛණ්ඩ රේඛා ය.

05. ඇඳීම මගින් ප්‍රකාශ නොවන්නේ මින් කුමක් ද?
(1) හැඩය (2) පිහිටීම (3) ප්‍රමාණය (4) මිල

06. ඇඳීමේ පුවරුවක් හා ටී රූලක් භාවිතා කරනුයේ,
(1) නිවැරදිව ලිවීමට ය. (2) පරිපථ සැකසීමට ය.
(3) කාර්ය චිත්‍ර ඇඳීමට ය. (4) මිණුම් කියවීමට ය.

07. ඇස්බැස්ටෝස් නිපදවීමේ දී ඇස්බැස්ටෝස් කෙඳි යොදනු ලබන ප්‍රතිශතය වන්නේ,
(1) 17% (2) 25% (3) 15% (4) 20%

Past Papers Wiki

08. යම් දෙයකට යොදනු ලබන බාහිර බලයක් හේතුවෙන් එය පුපුරායාම හඳුන්වනු ලබන්නේ,
(1) විලයනීයතාවය ලෙස ය. (2) භංගුරතාවය ලෙස ය.
(3) ප්‍රත්‍යාස්ථතාවය ලෙස ය. (4) තන්‍යතාව ලෙස ය.

09. ගෘහ භාණ්ඩ සෑදීමට වඩාත් යෝග්‍ය දැවය වන්නේ මින් කුමක් ද?
(1) දොඹ (2) ගිනිසපු (3) මහෝගනී (4) මී

10. දැව සංරක්ෂණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමයක් ලෙස පිළිගත හැක්කේ,
(1) මඩේ දැමීම (2) සොලිග්නම් ආලේපය
(3) ලිහිසි තෙල් ආලේප කිරීම (4) හුමාලයෙන් තැම්බීම

11. පැතලි කපන කටුවක මුවහත් කෝණය වන්නේ,
(1) 87° කි. (2) 118° කි. (3) 60° කි. (4) 30° කි.

12. භාවිතයෙන් ඉවත්වෙමින් පවතින ආවුදයක් වන්නේ මින් කුමක් ද?
(1) අත් කියත (2) තහඩු කියත (3) මුළුමට්ටම (4) අවගාරය

13. තහඩුවල හැඩ සකස් කිරීමට යෝග්‍ය මිටියක් වන්නේ,
(1) රබර් මිටිය (2) බෝල පෙති මිටිය
(3) ඉදිපෙති මිටිය (4) ඉහත සියල්ලම

14. අත් කියතක් මුවහත් කිරීමට භාවිතා කරන්නේ,
(1) රෝද ගිණිගල (2) තුන් හුලස් පීර (3) වැලිගල (4) රවුම් පීර

15. අනතුරු ඇතිවීමට බලපාන සාධකයක් නොවන්නේ මින් කුමක් ද?
(1) විදුලි කාන්දුව (2) යාන්ත්‍රික දෝෂ
(3) නොදැනුවත්කම (4) සැලකිලිමත් බව හා පිළිවෙළ

16. හුණු මිශ්‍ර බදාමවල දක්නට ලැබෙන ගුණයක් නොවන්නේ මින් කුමක් ද?
(1) සුවිකාර්යතා ගුණය (2) වැඩි සම්පීඩන ශක්තිය
(3) හැකිලීම අඩුවීමේ ගුණය (4) නම්‍යශීලී ගුණය

17. නියන භාවිතයේ දී එහි මිටට පහරදීමට යොදාගනු ලබන්නේ,
(1) මිටියයි. (2) අඬු මිටියයි. (3) අතකොලුවයි. (4) බෝල මිටියයි.

18. හුණු පිළිස්සීමේ රසායනික ප්‍රතික්‍රියාව නිවැරදිව දක්වා ඇත්තේ,

(1) $CaCO_3 \xrightarrow[\Delta]{} CaO + CO_2 \uparrow$ (2) $CaCO_3 \xrightarrow[\Delta]{} CaO_2 + CO_2 \uparrow$

(3) $CaO \xrightarrow[\Delta]{} CaCO_3 + CO_2 \uparrow$ (4) $CaO \xrightarrow[\Delta]{} CO_2 + CaCO_3$

19. පැතලි සරනේරු නිපදවීම සඳහා යොදාගන්නා ලෝහ වර්ග වන්නේ මින් කුමක් ද?
(1) පිත්තල හා මෘදු වානේ (2) තඹ හා චීනච්චට්ටි
(3) ඇලුමීනියම් හා චීනච්චට්ටි (4) ඇලුමීනියම් හා අධිකාබන් වානේ

20. විනිවිද පෙනෙන සිහින් ප්ලාස්ටික් බටයකට ජලය පුරවා සකස් කරගන්නා ආදේශ මිනුම් උපකරණයක් වන්නේ,
(1) ලෙවලය Sprit Level (2) ලෙවල් බටය Level Tube
(3) තියොඩොලයිට්ටුව Theodotlite (4) ලඹය Plumb bop

21. අවශ්‍යතාවය අනුව විවිධ කෝණ ඇඳගැනීමේ හැකියාව පවතින උපකරණය වන්නේ මින් කුමක් ද?
(1) වරක්කලය (2) මුළුමට්ටම
(3) ස්වාය මට්ටම් ලෑල්ල (4) කුඩුම්බි වරක්කලය

22. ආවුද උපකරණ අස්ථානගත වීම වළක්වා ගැනීමටත්, අවශ්‍ය අවස්ථාවල නොමැති උපකරණ පහසුවෙන් හඳුනාගැනීමටත් භාවිත කළ හැකි වඩා සුදුසුම ක්‍රමය වන්නේ,
(1) පෙට්ටියක ඇසිරීම ය. (2) රාක්කයක ඇසිරීම ය.
(3) සෙවනැලි පුවරුවක ඇසිරීම ය. (4) ඉහත සියල්ල යොදාගත හැක.

23. පෝරණුවේ පදම් කිරීම මගින් දැවයක අඩුකරගත හැකි ජල අනුපාතයේ ප්‍රතිශතය වන්නේ,
(1) 12% - 15% (2) 5% - 10% (3) 80% - 90% (4) 6% - 7%

24. ඉරි තැලීම හා ඇද ගැසීම සහිත ලා දම් පැහැයට ආසන්න වර්ණයෙන් යුත් ගඩොල්වල දෝෂය වන්නේ,
(1) ආස්තරික සහිත ගඩොල් (2) ඇඹරුණු ගඩොල්
(3) වැඩියෙන් පිළිස්සුණු ගඩොල් (4) අඩුවෙන් පිළිස්සුණු ගඩොල්

25. වැඩ කොටසක් වැඩ බංකුවකට තබා හිරකර අල්ලා ගැනීමට එම බංකුවේ සවිකර ඇති උපකරණය මින් කුමක් ද?
(1) T කරාමය වේ. (2) G කරාමය වේ. (3) දඬු අඬුව වේ. (4) අත් අඬුව වේ.

26. පහත දක්වා ඇත්තේ කොන්ක්‍රීට් මිශ්‍රණයක් සඳහා යොදාගන්නා ද්‍රව්‍ය ලැයිස්තුවකි. ඒවා අනුපිළිවෙළින් නිවැරදිව වර්ග කර ඇති පිළිතුර තෝරන්න.

* වැලි * සිමෙන්ති * මැටල්

(1) සියුම් සමාහාර, රළු සමාහාර, බැඳුම් ද්‍රව්‍ය (2) බැඳුම් ද්‍රව්‍ය, සියුම් සමාහාර, රළු සමාහාර
(3) සියුම් සමාහාර, සමාහාර, රළු සමාහාර (4) සියුම් සමාහාර, බැඳුම් ද්‍රව්‍ය, රළු සමාහාර

27. දැවයෙන් සාදන ලද භාණ්ඩයක කොටස් දෙකක් සෘජුකෝණීව එකලස් කිරීමෙන් අනතුරුව එහි සෘජුකෝණී බව නිවැරදිව පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි උපකරණය වන්නේ මින් කුමක් ද?
(1) වානේ කෝදුව (2) මුළුමට්ටම
(3) ස්වාය මට්ටම් ලෑල්ල (4) ලෙවලය

28. මධ්‍ය රේඛාවක් නිවැරදිව දක්වා ඇත්තේ,



(1) (2) (3) (4)

29. ප්‍රක්ෂේපන වර්ග හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන සංකේතය යොදාගන්නේ,
(1) පළමු කෝණ ප්‍රක්ෂේපණයේ දී ය.
(2) තෙවන කෝණ සෘජු ප්‍රක්ෂේපණයේ දී ය.
(3) සමාංශක ප්‍රක්ෂේපණයේ දී ය.
(4) ත්‍රිමාණ ප්‍රක්ෂේපණයේ දී ය.



30. කේතුවක් එහි අක්ෂයට ලම්භකව කැපීමෙන් ලැබෙන තලයේ හැඩය නිවැරදිව දක්වා ඇත්තේ,
(1) පරාවලය ලෙසය. (2) බහුවලය ලෙසය. (3) ඉලිප්සය ලෙසය. (4) වෘත්තය ලෙසය.

31. තිරසට ලම්භකව අඳිනු ලබන රේඛාව හඳුන්වන්නේ,

(1) සමාන්තර රේඛාව (2) සිරස් රේඛාව (3) ආනත රේඛාව (4) වක්‍ර රේඛාව

32. ජලය සහිත ස්ථානවල ඉදිකිරීම්වලට යෝග්‍ය දැවයකි,

(1) හල්මිල්ල (2) අඹ (3) කුඹුක් (4) සියඹලා

33. දැව කඳන් පරිවර්තනය කිරීමෙන් ලබාගන්නා දැව හඳුන්වනු ලබන්නේ,

(1) ස්වභාවික දැව නමිනි. (2) කෘත්‍රිම දැව නමිනි.

(3) නිෂ්පාදිත දැව නමිනි. (4) සකස්කරගත් දැව නමිනි.

34. සුමට කිරීමට සුදුසු ආවුදය වන්නේ,

(1) අඬු මිටිය (2) සූරන තහඩුව (3) කියත (4) අතකොලුව

35. කිසියම් භාණ්ඩයක මිනුම්, නිමාව, හැඩය, වර්ගය හා මිල වැනි දේ සවිස්තරව දැක්වීම එම භාණ්ඩයේ,

(1) නිර්ණායකය ලෙස ය. (2) සම්මතය ලෙස ය.

(3) භාවිතය ලෙස ය. (4) පිරිවිතර ලෙස ය.

36. දකුණු පස රූපයේ දක්වා ඇත්තේ,

(1) වල්ගා සරනේරුවකි.

(2) වවුල් සරනේරුවකි.

(3) පෙට්ටි සරනේරුවකි.

(4) පැතලි සරනේරුවකි.



37. සම්මත මිශ්‍රණ අනුපාතය 1 : 3 : 6 (40 mm) වන කොන්ක්‍රීට් භාවිතා කෙරෙනුයේ පහත සඳහන් කුමන ඉදිකිරීම් සඳහා ද?

(1) ඇතුරුම් පුවරුව හා තනි කොන්ක්‍රීට් සඳහා

(2) ජලගබඩා ටැංකි සඳහා

(3) කුළුණු බාල්ක සඳහා

(4) පෙර සවි කොන්ක්‍රීට් සඳහා

38. යම් වස්තුවක් විශාල කර ඇඳීමේ පරිමාණ භාගයක් නොවන්නේ මින් කුමක් ද?

(1) 1000 : 1 (2) 200 : 1 (3) 5 : 1 (4) 1 : 50

39. ඉලිප්සයක් නිර්මාණය කිරීමේ දී භාවිතයට නොගන්නේ මින් කුමක් ද?

(1) මහා අක්ෂය (2) නාභිය (3) සුළු අක්ෂය (4) වෘත්ත ඛණ්ඩය

40. භාවිතයට ගන්නා පරිමාණ කෝදුවගී ප්‍රධාන වශයෙන් වර්ග

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 6 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

88 S II

10 ශ්‍රේණිය

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II

කාලය පැය 02 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතු :-

- පළමුවන ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) පාදයක දිග 40 mm වූ සවිධි පංචාස්‍රයක් හා සවිධි සප්තාස්‍රයක් එකම පාදය මත අඳින්න.

(ii) 8 cm දිග AB සරල රේඛාවක් ඇඳ රේඛාව සමාන කොටස් තුනකට බෙදා එහි සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න.

(iii) විෂ්කම්භය 10 cm වූ වෘත්තයක් පැන්සල, කවකටුව, සරල දාරය පමණක් භාවිත කර කොටස් 12 කට බෙදන්න.

(02) ඉදිකිරීම් කටයුතුවල දී විවිධ සවිකුරු වර්ග භාවිතයට ගනු ලැබේ.

(i) දැව කර්මාන්තයේ දී භාවිත වන ඉස්කුරුප්පු ඇණ වර්ග 3 ක් නම්කර ඒවායේ රූප සටහන් අඳින්න.

(ii) මිටියෙන් පහරදීමෙන් සවිවන ඇණ තැබීමේ දී (කම්බි ඇණ) භාවිතයට ගත් දැව කොටස පැලීයන ලදී. එසේ වීමට බලපෑ හැකි හේතු දෙකක් ලියන්න.

(iii) එය වළක්වා ගැනීමට උපයෝගී කරගත හැකි ක්‍රම දෙකක් විස්තර කරන්න.

(03) (i) ගඩොල් නිපදවීමට යොදාගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය නම්කර එහි අඩංගු ප්‍රධාන සංඝටක දෙකක් ලියන්න.

(ii) ගඩොල්වල දැකිය හැකි දෝෂ තුනක් නම් කරන්න.

(iii) ගඩොල් බැම්මක් ඇඳ සිරස් කුස්තුරය හා හෝණ කුස්තුර නම් කරන්න.

(04) (i) වැරගැන් වූ කොන්ක්‍රීට් කණුවක් සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය 3 ක් ලියන්න.

(ii) කොන්ක්‍රීට් කණුවක් සැකසීමේ දී ඇතිවිය හැකි දෝෂ 3 ක් දක්වන්න.

(iii) වැරගැන්නුම් කම්බි වර්ග දෙකක් නම්කර වැරගැන්නුම් යෙදීමේ අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

(05) ආවුද මුවහත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(i) මුවහත් තැබිය යුතු ආවුද වර්ග 3 ලියන්න.

(ii) මුවහත් තැබීමට යොදාගන්නා උපකරණ 3 ක් නම් කරන්න.

(iii) අත් කියතක් මුවහත් තබන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(06) (i) පිරිවිතර අනුව ආවුද උපකරණ තෝරාගැනීමෙන් ලැබෙන වාසි 3 ක් ලියන්න.

(ii) භාවිතාකරන ක්‍රමය අනුව ආවුද හා උපකරණ කාණ්ඩ දෙකකට වෙන්කෙරේ. ඒ මොනවා ද? උදාහරණ සහිතව දක්වන්න.

(iii) කැපීමේ හා සැහීමේ ආවුද උපකරණ පහක් නම්කර ඉන් තුනක පැහැදිලි රූප සටහන් අඳින්න.

(07) සෑම කාර්යයක් ම සිදුකිරීමේදී අනතුරු සිදුවිය හැකිය. අනතුරු වළක්වා ගැනීමට සහ ආරක්ෂාවට ප්‍රමුඛ ස්ථානය ලබාදිය යුතුයි.

(i) ආරක්ෂක පූර්වෝපා යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) අනතුරු ඇතිවීමට බලපාන සාධක පහක් ලියන්න.

(iii) සෙවණැලි පුවරුවක් ඇඳ එහි ප්‍රයෝජන කෙටියෙන් පැහැදිලි කරන්න.

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I කොටස

1 - (2)	11 - (2)	21 - (3)	31 - (2)
2 - (1)	12 - (4)	22 - (3)	32 - (2)
3 - (4)	13 - (4)	23 - (1)	33 - (1)
4 - (4)	14 - (2)	24 - (3)	34 - (2)
5 - (4)	15 - (4)	25 - (3)	35 - (4)
6 - (3)	16 - (4)	26 - (4)	36 - (2)
7 - (3)	17 - (2)	27 - (2)	37 - (1)
8 - (2)	18 - (1)	28 - (2)	38 - (4)
9 - (3)	19 - (1)	29 - (1)	39 - (4)
10 - (1)	20 - (2)	30 - (4)	40 - (1)

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

පිළිතුරු පත්‍රය - II කොටස

(01) (i)



1. නිවැරදි නිමාව
2. නිර්මාණ රේඛා පැහැදිලි බව
3. නම්කර මිණුම් යෙදීම
4. නිමාව සඳහා

(ලකුණු 10)

(ii)



(iii)



(ලකුණු 05)

(ලකුණු 05)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු - ඉතිරි කොටස

02. (i) * රවුම් හිස සහිත ඉස්කුරුප්පු ඇණ
* රවුම් හිස සහිත පිලිප්ස් ඉස්කුරුප්පු ඇණ
* පැතලි සපරම් හිස සහිත ඉස්කුරුප්පු ඇණ

(ii) සිසුන්ගේ පිළිතුරුවල නිවැරදි හා ප්‍රායෝගික බව සලකා ලකුණු ලබාදෙන්න.

(iii) * අවශ්‍ය ප්‍රමාණයේ ඇණ තෝරාගැනීම.
* ඇණ තුඩට සබන්, ඉටි, ග්‍රීස් වැනි ද්‍රව්‍ය ස්වල්පයක් යොදා ඇණ තැබීම.
* දැවවල ස්වභාවය අනුව ඇණ තෝරාගැනීම. (ලකුණු 10)

03. (i) මැටි, සංඝටක, ඇලුමිනා Al_2O_3, සිලිකා SiO_2

(ii) ආස්තරික සහිත ගඩොල් / පිපිරුම් සහිත ගඩොල් / පලුදු සහිත ගඩොල්

(iii) වරි තුනක හතරක බඩගල් බැම්මක් ඇඳ නම් කර තිබිය යුතුයි. (ලකුණු 10)

04. (i) හැඩයම් පෙට්ටිය / ලෑලි / ඇණ / වානේ කම්බි / සමාහාර ද්‍රව්‍ය

(ii) සිරස් බව නැතිවීම / නියමිත මිණුම් රහිත වීම / වැරගැන්නුම් මතුවී තිබීම

(iii) දඟර වානේ, නාරටි වානේ, මෘදු වානේ (ලකුණු 10)

05. (i) අත් කියත, තහඩු කියත, නියන් වර්ග

(ii) වැලිගල, තෙල්ගල, රෝද ගිනිගල, පීරි වර්ග

(iii) කියතේ දත් උස් මිටි ගැම / දත් හැඩය සැකසීම / තෙත්තියන් තැබීම / මුවහත තැබීම (ලකුණු 10)

06. (i) කාර්ය නිවැරදිව කළහැකි වීම / කාර්ය වඩා පහසු වීම / කාලය ඉතිරිවීම / අනතුරු වැළකීම

(ii) අත් ආවුද / බලවේග ආවුද / අත් විදුම් යන්ත්‍රය / බහු කාර්ය ලී වැඩ යන්ත්‍රය

(iii) අත් කියත / තහඩු කතුර / තහඩු කියත / ලෝහ කියත (ලකුණු 10)

07. (i) පුද්ගල ආරක්ෂාව හා ආවුද උපකරණවල ආරක්ෂාව දක්වා තිබීම.

(ii) ගින්න, රසායනික ද්‍රව්‍ය, ආලෝක කිරණ, විදුලි කාන්දු

(iii) සෙවණැලි පුවරුව ඇඳ තිබීම / උපකරණ හඳුනාගැනීමට පහසුයි / ඒවායේ ආරක්ෂාව සඳහා / ගබඩා කිරීමේ පහසුව (ලකුණු 10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank